# රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
# මිල ගණන් කැඳවීමයි

ප්‍රසම්පාදන අංකය - DMC/FIN/2021 (PROCU: 23)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ටෙන්ට් (Tent) 30ක් මිලදී ගැනීම වෙනුවෙන් වන ප්‍රසම්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ.

ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධව ඔබ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම්, මේ සමඟ පහතින් දක්වා ඇති පිරිවිතරයන්ට අනුව වන ඔබ ආයතනයේ මුද්‍රා තැබූ මිල ගණන් 2021.08.20 දින පෙ.ව.10.30 හෝ ඊට පෙර “Procurement of Tent” යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර සභාපති - ප්‍රසම්පාදන කමිටුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රසම්පාදන ඒකකය, මුදල් අංශය, 3 වන මහළ, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ 3 වන මහලේ, මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනැවිත් බහාලන මෙන් කාරුණිකව දන්වමි.

තවද, මිල ගණන් ඉදිරිපත් කිරීමේදී මේ සමඟ පහත දක්වා ඇති පිරිවිතර ලේඛනය සම්පූර්ණ කර ඔබ ආයතනයේ බලයලත් නිලධාරියෙකුගේ අත්සන හා ආයතනයේ නිල මුද්‍රාව තබා මිල ගණන් ඉදිරිපත් කිරීම හා මිල ගණන් සමඟ සාම්පල් (Material Sample) යොමු කිරීම අනිවාර්යය වේ.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තාක්ෂණික ඇගයීම සිදු කරන අවස්ථාවේදී, නිෂ්පාදිත භාණ්ඩයක සාම්පලයක් (Product Sample) පරීක්ෂා කිරීමට අවශ්‍ය බව දැනුම් දීමෙන් පසු අදාළ සාම්පල් ඉදිරිපත් කිරීමද අනිවාර්යය අවශ්‍යතාවයක් වේ.

සභාපති - ප්‍රසම්පාදන කමිටුව
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
විද්‍යා මාවත
කොළඹ 07.
දු.අ. 0112-136270 / 011-3668096